*සැ. යු.-* 2017.08.25 දින පළවූ අංක 2034 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,035 - 2017 අගෝස්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1648 |

*සැ. යු.*-(i) ශ්‍රී ලංකා රිෆායි තරීක් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2017 අගෝස්තු මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 සැප්තැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 2018 අධ්‍යයන වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම

2018 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය සහ යාපනය යන විශ්වවිද්‍යාලවල පැවැත් වේ.

03. එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකි ය.

1. කොළඹ විශ්වවිද්‍යාලය - සිංහල සහ දෙමළ මාධ්‍යය
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය - සිංහල මාධ්‍යය
3. යාපනය විශ්වවිද්‍යාලය - දෙමළ මාධ්‍යය

04. සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතු ය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම,
(ii) 2017.09.22 දිනට වයස අවුරුදු 50 ට නොවැඩි වීම,
(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්ත වීම,
(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව /උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත වෙනත් ආයතනයකින් උපාධියක් හෝ ඒ හා සමාන මට්ටමේ ලා සැලකෙන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.
(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලැබ සේවය කිරීම.
  (අ) * ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවය
  * ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය
  * ශ්‍රී ලංකා ගුරු සේවය
  (ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය
  (ඇ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය
  (ඉ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

(vi) 2017.09.22 වැනි දිනට අංක 04 (v) හි දක්වා ඇති සේවාවකට අයත් තනතුරක උපාධිධාරියකු ලෙස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සැලකිය යුතුයි :-*

(i) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීම් ලබා ඇති ගුරුවරුන් 2017.09.22 වැනි දිනට තම පත්වීමට අදාළ බැඳුම්කරයේ කාලසීමාව වන අනිවාර්යය පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ වී තිබේ නම් හා 4 (vi) හි සඳහන් සුදුසුකම් සපුරා තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(ii) අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයකට යටත්ව සිටින අයදුම්කරුවන් 2017.09.22 වැනි දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්යය සේවා කාලය අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක්වත් (05) සම්පූර්ණ කර තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

(iii) අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකි ය.

05.

05. 1 තෝරා ගැනීමේ පිළිවෙල :

(i) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

(iii) *ගැසට් නිවේදනයේ* අංක 04 (v) හි අයදුම්කරු අයත් වන සේවාවට/සේවාවලට අදාළ තනතුරෙහි/ තනතුරුවල සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත. සේවා කාලයේ එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ. සේවා කාලය සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. අයදුම්කරුවකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු/ ඇය 4(v)හි දැක්වෙන සේවාවන් අතුරින් මුලින් ම පත්වීම ලද සේවයේ අදාළ තනතුරෙහි වැඩ භාර ගත් දින සිට ය.

*සැලකිය යුතුය :-*

04.(v) හි සඳහන් සේවාවක/ සේවාවල, තනතුරක/ තනතුරුවල අඛණ්ඩ සේවා කාලයක් පැවතිය යුතු ය.

(iv) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම් කළහොත් පාඨමාලාවට තෝරාගනු ලබන සංඛ්‍යාවෙන් 1% ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.

(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලබන සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

05.2 ලිඛිත පරීක්ෂණය :-

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවල දී පැවැත් වේ.
(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා ඉල්ලුම් කළ මධ්‍යස්ථානයේ දී ඉල්ලුම් කළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකි ය. අයදුම් කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.
(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳව ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් කටයුතු කළ යුතු ය.
(iv) ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත ය.

(අ) සාමාන්‍ය දැනීම :-
කාලීන තොරතුරු, සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටලු පිළිබඳ ප්‍රශ්න පත්‍රය
(කාලය පැය 01)
(ආ) අභියෝග්‍යතාවය :-
භාෂා හැකියාව, අවබෝධය, තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය
(කාලය පැය 01 යි මිනිත්තු 30 යි)

05.3 සම්මුඛ පරීක්‍ෂණය :

(i) සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් *ගැසට්* නිවේදනයේ 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතු ය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට්* නිවේදනයේ අංක 04 (v) හි සේවාවක/ සේවාවල, අදාළ තනතුරෙහි/ තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන්ම මුල් පත්වීමට අදාළ තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතු ය. එය අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණු ලබා ගැනීමට උපකාර වනු ඇත.

(iii) රජයේ ලියාපදිංචි පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරුභවතුන්,

(අ) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත්,
(ආ) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බවටත්,
(ඇ) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදා ගන්නා බවටත්,
(ඈ) අදාළ ගුරුභවතාගේ අධ්‍යයන කාලය තුළ ඔහු/ ඇය ගේ පුරප්පාඩුවට වෙනත් ගුරුවරයෙකු බඳවා නොගන්නා බවටත්,
(ඉ) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත්, ආයතනයේ කෘත්‍යාධිකාරී/ පාලක මණ්ඩල කළමණාකරු විසින් සහතික කරන ලද ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

06. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

(i) දී ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කළ යුතු ය.

(ii) දෘශ්‍යාබාධිත/ ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතු පාටින් "දෘෂ්‍යාබාධිත/ ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) විභාග ගාස්තු ගෙවීම :
විභාග ගාස්තු වශයෙන් රු. 900 ක මුදලක් ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි ඇලවිය යුතු ය.

2017.08.31 දින සිට 2017.09.22 දින දක්වා සියලුම තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවනු ඇත.

(iv) අයදුම්පත් එවීම :-
(අ) අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ " පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභන්තර) පූර්ණ කාලීන පාඨමාලාව - 2018" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ආ) 2017.09.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ " විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.

(ඇ) ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට ආයතන ප්‍රධානියා මගින් භාරදිය යුතු වේ. එය පාඨමාලාව සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුට/ ඇයට අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී උපකාරී වනු ඇත.

(v) කාලසටහන් හා ප්‍රවේශපත්‍ර විභාග අපේක්ෂකයින් වෙත තැපැල් මගින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර නොලැබුණහොත් "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිතව දැන්විය යුතු වේ.

(අ) විභාගයේ නම :————.
(ආ) විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(ඇ) ලිපිනය :————.
(ඈ) මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය: ————.
(ඉ) ඉල්ලුම්පත තැපැල් කළ දිනය :————.

(ඊ) ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :———.

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාරදීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව, වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මඟින් තහවුරු කළ යුතු ය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවකු යම් විශ්වවිද්‍යාලයකට තෝරා ගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරා ගැනීමෙන් පසුව වුව ද *ගැසට් නිවේදනයට* අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂකයකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදු වේ.

07. *අධ්‍යයන නිවාඩු* :

තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ ජාතික පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවයේ නියුක්ත විදුහල්පති ශ්‍රේණිධාරීන් සහ ගුරුවරුන් අධ්‍යයන නිවාඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද සෙසු අයදුම්කරුවන් අධ්‍යයන නිවාඩු අදාළ පළාතේ අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කර ගත යුතු වේ.

08. *බැඳුම්කරය* :

පාඨමාලාවට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීති රීති අනුව නියමිත කාල පරිච්ඡේදයක් ඔහු/ ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට අධ්‍යාපන ලේකම්/ පළාත් අධ්‍යාපන ලේකම් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු වේ.

09. තෝරාගනු ලැබූ අයදුම්කරුවකු පාලනය කර ගත හැකි හේතූන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාලසීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

11. මෙම *ගැසට් නිවේදනයෙහි* සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

2018 අධ්‍යයන වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීම.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| ඉල්ලුම් කරන මාධ්‍යය ( සිංහල/දෙමළ) | ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය) | ඉල්ලුම් කරන විශ්ව විද්‍යාල (කොළඹ/යාපනය/පේරාදෙණිය) *සැ.යු:-* මනාපය අනුපිළිවෙළින් විශ්වවිද්‍යාල දෙක සඳහන් කරන්න |
|---|---|---|
| | | 1.<br>2. |

01. (i) මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන් ) :————.
*උදා* : Mr. SILVA A.B.C.

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) *(අ)* රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
*(ආ)* රාජකාරි දුරකථන අංකය :————.

(ii) *(අ)* පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
*(ආ)* පෞද්ගලික දුරකථන අංකය :————.

(iii) සේවය කරන පාසලේ/ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය |
|---|---|---|
| | | |

(iv) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/ පෞද්ගලික පාසල්/ පිරිවෙන්/ වෙනත් ) :————.

03. (i) උපන් දිනය ඃ අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(ii) 2017.09.22 වැනි දිනට වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————.
(iii) ස්ත්‍රී /පුරුෂ භාවය :————.

04 උපාධිය පිළිබඳ විස්තර ඃ

| උපාධිය | විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය (...... සිට ...... දක්වා) | උපාධිය සමත් වූ වසර | උපාධිය වලංගු දිනය | උපාධි විෂයයන් | සාමර්ථ්‍යයේ ස්වභාවය | විශ්ව විද්‍යාලය/ ආයතනය | උපාධිය (අභ්‍යන්තර/ බාහිර) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

05.(i) *(අ)* ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයට/ ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට/ශ්‍රී ලංකා ගුරු සේවයට පත්වූ දිනය ඃ————.
*(ආ)* එම සේවයේ වැඩ භාරගත් දිනය ඃ————.
*(ඇ)* දැනට දරන තනතුර ඃ————.

(ii) *(අ)* ශ්‍රී ලංකා විදුහල්පති සේවයට/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය ඃ————.
*(ආ)* ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ භාරගත් දිනය ඃ————.

(iii) උපාධියෙන් පසු 2017.09.22 වැනි දිනට 4 v හි සඳහන් අදාළ සේවයේ/සේවාවල සේවා කාලය ඃ————.

(iv) 2017.09.22 වැනි දිනට 4 v හි සඳහන් අදාළ සේවයේ/ සේවාවල සම්පූර්ණ සේවා කාලය ඃ————.

06. වෘත්තීය පුහුණුව පිළිබඳ විස්තර ඃ

| *පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත්)* | *පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය)* | *ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාලසීමාව* | |
|---|---|---|---|
| | | *දින සිට* | *දින දක්වා* |
| | | | |

07. ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :

| *අධ්‍යයන නිවාඩුවේ ස්වභාවය (වැටුප් සහිත/ වැටුප් රහිත, දේශීය/විදේශීය)* | *අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය* | *කවර කාලසීමාවේ ද යන්න* | *බැඳුම්කර කාලය (........ දින සිට ........ දින දක්වා)* | *බැඳුම්කර කාලය සම්පූර්ණ කර ඇති ද/ නැති ද යන වග (සම්පූර්ණ නැතිනම් ඒ සඳහා ඉදිරියට ඇති කාලය සඳහන් කරන්න.)* |
|---|---|---|---|---|
| | | | | |

*සැලකිය යුතු ය :*
මීට පෙර ලබා ඇති අධ්‍යයන නිවාඩුවලට අදාළව උක්ත වගුව නිවැරදිව සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*සටහන :* ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැලකේ.

08. *(අ)* ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවතී ද ? ඔව් /නැත .
*(ආ)* පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු :————.

09.

| | |
|---|---|
| තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | කුවිතාන්සි අංකය :<br>දිනය :————.<br>......................................තැපැල්/උප තැපැල් කාර්යාලයට රු ............ (මුදල අකුරෙන්) ගෙවන ලද බවට සහතික කරමි.<br>අයදුම්කරුගේ අත්සන :————.<br>දිනය :————. |

10. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බවට ද 2017.08.31 වැනි දින *ගැසට්* නිවේදනයේ 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවට ද, විභාග පනතේ අයදුම්කරුවන් සඳහා වූ නීතිරීති වලට එකඟව කටයුතු කරන බවට ද, නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවට ද මෙයින් සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

11. පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීමේ නිර්දේශය :

(විදුහල්පති, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පීඨාධිපති, කෘත්‍යාධිකාරී, පාලක මණ්ඩලයේ කළමණාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.)

පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සලකා බලා මෙම අයදුම්කරු සේවයෙන් නිදහස් කරමි/ නොකරමි.

————,
විදුහල්පති ගේ / ආයතන ප්‍රධානියා ගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

12. පාඨමාලාව සඳහා අයදුම්කරු නිදහස් කිරීම පිළිබඳ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ නිර්දේශය :

උක්ත නම් සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

......................................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
(අත්සන හා නිලමුද්‍රාව)

දිනය :————.

08-1031

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2017) - II

## First Efficiency Bar Examination for Senior Statisticians and Statisticians of the Department of Census and Statistics - 2013 (2017) - II

01. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ තනතුරට අයත් නිලධාරීන් සඳහා අදළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2017 දෙසැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. විභාග ගාස්තු :

විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගය සඳහා හෝ එක් විෂයයක් හෝ විෂයයන් කීපයක් සඳහා හෝ මුල්ම වතාවට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු.600/- ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු.1200/-ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අය කිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. අයදුම්පත්‍ර :

අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව *A4* ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස්කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙලකරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2017.10.02 වන දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය*

අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතරින් කුමක් වුවද, භාරගනු ලැබේ.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
ii. වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

06. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීමට අදළ නම්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුවන්ගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත, විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත්

කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 2 හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු වේ නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරුද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීමද ප්‍රතිඵලදායී වනු ඇත.

07. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුවන්ගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිය ලත් නිලධාරියකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේනමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. එමෙන්ම, විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

08. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ. තමාට නියමිත විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු අතර, තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ලෙස, තරඟ විභාගයක් තුලින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, අදාළ තරඟ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යයද, තරඟ විභාගයකින් තොරව රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාගය කොළඹදී පමණක් පැවැත්වේ.

11. විභාග පටිපාටිය.

ඉහත තනතුරට අදළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත :

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 1. පරිපාලනය | 1 | 100 | පැය 02 යි |
| 2. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 2 | 100 | පැය 02 යි |
| 3. ඉංග්‍රීසි | 3 | 100 | පැය 02 යි |
| 4. ව්‍යවහාරික සංඛ්‍යානය | 4 | 100 | පැය 03 යි |

(01) පරිපාලනය (විෂය අංක 01)

- කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම
- ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XII, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII
  (ඉහත පරිච්ඡේදයන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ I වන කාණ්ඩයේ විධිවිධානයන්ට යටත්ව අවධානයට ගතයුතු වේ.)

(02) රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂය අංක 02)
මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද

I - සියලුම වගන්ති
II - සියලුම වගන්ති
III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1, 2, 3, 4 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1, 2, 3, 4 සහ 6 වන වගන්ති

(03) ඉංග්‍රීසි (විෂය අංක 03)

**English Grammar**

A suitable level of proficiency on the following forms of grammar in spoken and written language is expected from the candidate.

- Tense and Number
- Sentences (Simple/ Compound/ Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

**Writing Skills**

The knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Internal modes of Communication
- Formal Correspondences skills
- Writing Descriptions / Explanations
- Summary writing skills
- Report Writing Skills
- Minutes of Meeting / Agendas/ Invitations
- Comprehension

**Reading Skills**

Candidate's ability to comprehend a printed text ; infer meaning and Verbal / written interpretation is expected.

* Reading and understanding the specific and general meaning of the printed text.
* Reading and Interpretation (Verbal/Written)
* Understanding the cohesion and coherence of a passage.

(04) ව්‍යවහාරික සංඛ්‍යානය (විෂය අංක 04)
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත, කෘෂිකර්ම සංඛ්‍යාති, ජාතික ගිණුම්, තොරතුරු තාක්ෂණ (දත්ත සැකසුම්), නියැදි සමීක්ෂණ, ජන සංගණන හා ප්‍රජා විද්‍යා, මිල දර්ශකාංග හා සිතියම් යන අංශ මඟින් සිදුකරනු ලබන සංඛ්‍යානමය කාර්යයන් පිළිබඳව අදාළ නිලධාරීන්ගේ දැනුම ඇගයීම පිණිස සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

11.1 එක් එක් විෂයයෙන් සාමාර්ථය ලැබීම සඳහා 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු අතර, කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා සෑම විෂයයකින්ම සාමාර්ථය ලැබිය යුතුය. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිප වරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

12.1 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013 (2017) - II**

**First Efficiency Bar Examination for Senior Statisticians and Statisticians in Department of Census and Statistics - 2013 (2017) - II**

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4

01. මුලකුරු අගට යොද අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :-
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SUNIL, J.M.U

1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම :-
(උදා: GUNAWARADHANA, H.M.S.K)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්)
:———.

02. *සේවා ස්ථානය හා ලිපිනය :*

2.1 සේවා ස්ථානයේ නම :———.

2.2 රාජකාරි ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)

03. 3.1 *ස්ත්‍රී/පුරුෂභාවය :*
පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :-
[ | | | | | | | | | | | ]

3.3 *උපන් දිනය :-*

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| [ \| \| \| ] | [ \| ] | [ \| ] |

04. ඔබ ඉදිරිපත් වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන් (*ගැසට්* නිවේදනයේ 10 වැනි ඡේදය බලන්න)

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

05. දැනට දරන තනතුර :————.

5.1 පත්වීම් ලිපියේ අංකය :————.

5.2 පත්වීම් දිනය :————.

06. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ? :————.

6.1 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

6.2 ලදුපත් අංකය :————.

6.3 දිනය :————.

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. (අදාල නම් පමණි)<br>(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරන අතර, මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ
අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළයුතු ය.

අත්සන සහතික කිරීම

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................ .. මයා/මිය/මෙනෙවිය ........................................................ දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි.

————.
සහතික කරන නිලධාරියාගේ
අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා / නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

08-1117

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

(ISO 9001 : 2008 තත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2017**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.

පාසැල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව
NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full Time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,500.

**මයික්‍රොසොෆ්ට් ඔෆිස්** - Microsoft Office

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලයඃ මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල හා ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,000.

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය** - Computer Graphic Design

ග්‍රැෆික්, මුද්‍රණ සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

**කාලයඃ මාස 04 1/2 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි**

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 16,500 NVQ සහතිකපත් පාඨමාලාව රු. 20,500

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම** - Computer Typesetting and Layout Design

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලයඃ මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,500

**වෙබ් අඩවි නිර්මාණය** - Web Designing

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලයඃ මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,500

**ඕෆ්සෙට් ලිතෝකරණය** - Offset Lithography

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත.

කාලය : වසරයි. (අර්ධ කාලීන) මාධ්‍යය: සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,500

**ත්‍රිමාණ සජීවීකරණය** - Digital Animation

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මානකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොද ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,500

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම** - Computer Hardware and Assembly

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර එදිනෙද පැනනගින දෘඩාංග/මෘදුකාංග වල අදළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500

**මුද්‍රණ ක්ෂේත්‍රයට අදළ පිරිවැයකරණය සහ ඇස්තමේන්තුකරණය** - Costing and Estimating for Printers

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Job Costing and Estimating) පිළිබඳ පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ග්‍රැෆික්ස් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

පාඨමාලා කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,500

**පොත් බැඳීම හා නිමාකරණය** - Book Binding and Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

කාලය : මාස 07යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 16,500

**ආංකික පෙර මුද්‍රණය** - Digital Prepress

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබාගත හැක.

පාඨමාලා කාලය : වසර 1යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,500

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්‍ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 011 2686162, 011 2679791

ෆැක්ස් : 011 2686162, ඊ-මේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.

දුරකථන අංක : 066-2222172, 071 0554298.

08-1146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.